# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ මනෝවිද්‍යාව
(නව නිර්දේශය)

**බෞද්ධ ව්‍යවහාරික මනෝවිද්‍යාව හැඳින්වීම හා බෞද්ධ ප්‍රජානන මනෝවිද්‍යාව**
**BUPS – 28224**

යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ඇතුළත් වන සේ තෝරාගත් ප්‍රශ්න **පහකට (05)** පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### I කොටස

01. සමාජයීය සාධක ඇසුරෙන් උද්ගත වන පුද්ගල මානසික ගැටලු අවම කර ගැනීම සඳහා සමාජ යහපැවැත්ම විෂයෙහි බුදුන්වහන්සේ විසින් අනුදත් ඉගැන්වීම් අදාළ කරගත හැකි ආකාරය පරීක්‍ෂා කරන්න.

02. අහේතුවාදී චින්තනය හේතුවෙන් උද්ගත වන බොහෝ මානසික ගැටලුවලට විසඳුම් සපයා ගැනීමේ දී පටිච්චසමුප්පාද සිද්ධාන්තයෙහි උපයෝගිතාව අනාවරණය කරන්න.

03. 'සන්තුට්ඨී පරමං ධනං' යන ප්‍රකාශයෙන් අවධාරණය වන පරිදි සතුට මිනිසාගේ පරම ධනය වන්නේ කුමන පදනමකින්දැයි පැහැදිලි කරන්න.

04. පරම විමුක්තිය විෂයෙහි මෙන් ම පුද්ගල සදාචාරය විෂයෙහි ද බුදුසමයාගත ආර්ය අෂ්ටාංගික මාර්ගය ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

05. බෞද්ධ භාවනා ක්‍රමවේද පුද්ගල මානසික ඒකාග්‍රතාව ඇති කිරීම විෂයෙහි මෙන්ම මානසික පාරිශුද්ධභාවය විෂයෙහි ද අදාළ වන ආකාරය පෙන්වා දෙන්න.

### II කොටස

06. 'සංජානනය' යන්න හඳුන්වා, ආදි බෞද්ධ ඉගැන්වීම් තුළ සංජානනය විග්‍රහ වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

07. මනසෙහි ව්‍යුහය හා එහි ක්‍රියාකාරිත්වය සිදුවන ආකාරය අදාළ බෞද්ධ මූලාශ්‍රයානුසාරයෙන් සාකච්ඡා කරන්න.

08. ප්‍රපඤ්ච ගොඩනැගීමේදී අභ්‍යන්තර ආයතන හා බාහිර අරමුණුවල ඒකාබද්ධතාව බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් අවධාරණය වන ආකාරය ප්‍රකට කරන්න.

09. 'භාෂාවෙහි එකම කාර්යය අදහස් ප්‍රකාශ කිරීමම නොවන අතර, එය මානව චින්තනය ගොඩනැගීමේ සුවිශේෂී සාධකයක් ද වේ.' භාෂාව පිළිබඳ බෞද්ධ ආකල්පය ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට (02) පමණක් ප්‍රමාණවත් කෙටි සටහන් සපයන්න.

i. මතකය
ii. අනුසාසනා
iii. විතක්ක
iv. සඤ්ඤා

***************************